23 JUL 2019

# "නැකැත් සැණකෙළිය" නම් වූ රාජකීය උත්සවය පිළිබඳ සමාලෝචනයක්

- කුඩාවැවේ සෝමානන්ද හිමි

නැකැත් කෙළිය ඉතාමත් විනෝදාත්මක සැණකෙළියක් වන අතර එය රාජකීය උත්සවයකි. කෑම, බීම, නැටීම්, ගී කීම් ආදියෙන් සමන්විත ප්‍රීතිමත් උත්සවයක් වශයෙනුත් එය පෙන්වා දිය හැකිය. සංස්කෘත කෘත්තිකා යන්නෙන් නම් ලත් කාර්තික උත්සවය ඉල් මාසයේ පැවැත්වෙන බව **සද්ධර්මරත්නාවලියෙන්** පෙනේ.[1] නැකැත් සැණකෙළිය පොසොන් මාසයේ පවත්වන බව **සද්ධර්මාලංකාරයෙන්** පැහැදිලිය. **කව්සිළුමිණෙන්** පෙනෙන්නේ නැකැත් කෙළීම යනුයි. වික්‍රමසිංහ මහතා සඳහන් කරන්නේ උයන්, දිය කෙළි ශරත් ඍතුව ආරම්භයේදීම පැවැත්වුණු බවත්ය. මෙම උත්සව සියල්ලෙහිම පොදු ලක්ෂණ තිබිය හැකි වුවද ඒ සෑම උත්සවයක්ම එකම උත්සවයක් යැයි තවත් සාක්ෂි නොමැතිව නිගමනය කිරීමට අසීරු බව ආරියපාල මහතා සඳහන් කරයි.[2]

ඇම්. බී. ආරියපාල මහතා ඉතාමත් විනෝදාත්මක සහ රාජකීය උත්සවයක් වන නැකැත් සැණකෙළිය අතිශයින්ම විනෝදාත්මක මෙන්ම අනාචාරයට පවා තුඩු දෙන එකක් සේ සඳහන් කරයි.[3] මෙය රාජ්‍ය අණ පරිදි දින සතක් පුරාවට පැවැති අතර කෑම, බීම, නැටීම්, ගී කීම් ආදියෙන් සමන්විත ප්‍රීතිමත් උත්සවයකි. තරුණියන් රිසි සේ නිදහසේ හැසිරුණු අතර දිය කෙළි හා උයන් කෙළි අත්‍යවශ්‍ය වූවකි. **පූජාවලියේ** එන ''එදා මතු මාලෙන් යටිමාලට නොබස්නා යටි මාලෙන් එළිපත පැන පිටතට නොයන කුල ස්ත්‍රී තමන් තමන්ගේ ගෙවලින් නික්ම පිරිවර හා සමඟ සියලු සතුන්ටම පෙනී පෙනී උයන් පොකුණු ගංතොට ආදීයෙහි සිත් සේ කෙළමින් සෙමින් ඇවිදිනාහුය.

එදවස් රජ බමුණු වෙළඳ ගොවි සිවු කුලයෙහි ශ්‍රීමත් වූ සල්ලාල පුරුෂයෝ අද අප හා සමාන කුල ඇති උත්තම ස්ත්‍රීන් සිත් සේ බලම්හයි සුවඳ මල් කඳු ගෙන ඒ ඒ සන්ධියෙහි සිටගෙන කැමැති කැමැති කුල ස්ත්‍රීන් කරට මල්දම් දම දමා සිත් සේ කෙළනාහුය.'' තොරතුරු මඟින් එය තවදුරටත් පැහැදිලි වේ.[4]

මෙම නැකැත් සැණකෙළිය පිළිබඳ අදහස් දක්වන මාර්ටින් වික්‍රමසිංහ මහතා **කව්සිළුමිණේ** එන උයන් දිය කෙළිය ද මේ සැණකෙළි විශේෂයම යැයි ද කාර්තිකෝත්සව යන්නෙන් දැක්වෙන්නේත් මෙම උත්සවයටම යැයි ද සඳහන් කරයි.[5] තවද **මහාවංසයේ** එන චිත්තරාජ උත්සවය උයන් කෙළි හා සම්බන්ධ වූ සශ්‍රීකත්වය පිළිබඳව වූ පූජා විධියකැයි ද ඔහු සඳහන් කරයි. පරණවිතාන මහතා අදහස් කරනු ලබන්නේ මෙම චිත්තරාජ උත්සවය පැරණි රෝමාණුවන්ගේ සැටර්නේලියා (Saturnalia) නම් උත්සවය හා සමාන වූවකැයි ද කාර්තිකෝත්සව යන්නෙන් දැක්වෙන්නේත් මෙයම යැයි මාර්ටින් වික්‍රමසිංහයන් සඳහන් කරයි.[6]

බෝසතාණෝ තුසිත පුරයෙන් චුතව ඇසළ මස මැදි පොහෝ දින උතුරුසළ නැකතින් අලුයම් කාලයෙහි මහාමායා දේවින් කුස පිළිසිඳ ගත් දිනය කපිලවස්තු නම් නුවර ඇසළ කෙළි නැමැති උත්සවය පැවැති අවස්ථාවෙහි වූ බව **පූජාවලියේ** සඳහන් වේ.[7] තවද මෙම නකත් කෙළි උත්සවය අවුරුදු පතා සිදු කෙරෙන උත්සවශ්‍රීය මෙන්ම විනෝදාත්මක සැණකෙළියක් බව "එකල එනුවර අවුරුදු පතා කෙළෙනා වූ නකත් කෙළි නම් උත්සවයෙක් විය" යනුවෙන් පූර්වාරාම පූජා කථාවෙහි දැක්වීමෙන් පෙනෙයි.[8] එසේම බෝධිමණ්ඩල පූජා කථාවෙහි ''ඒ නුවර පළමු සත් දවසෙක පටන් ඇසළ කෙළි නම් වූ නකත් කෙළියෙක් විය. මනුෂ්‍යයෝ තමන් තමන්ගේ කර්මාන්ත හැර නුවරට වැද උත්සව කෙළි කෙළනාහුය.''යනුවෙන් තොරතුරු ඇතුළත් වේ.[9]

**සද්ධර්මරත්නාවලියේ** සාමාවතීන්ගේ කථාවේ එක් අවස්ථාවක නැකැත් කෙළියක් පිළිබඳව තොරතුරු ''ඒ නුවර



නකත් කෙළි නම් වූ සැණකෙළියෙක් විය. ඒ සැණකෙළි දිනයෙහි උඩු මහලින් බිම් මහලට නොබස්න, බිම් මහලින් පිටතට නොනික්මෙන ඉසුරුමත් කුල ස්ත්‍රීහු පවා තම තමන්ගේ පිරිවර හා සමඟ පයින්ම නික්ම ගං හෝ ආදියට ගොස් සිත් සේ දිය කෙළ ඉස් සෝධා නහා මල් සුවඳ පැළඳ කෙළඇවිදිති'' යනුවෙන් දැක්වේ.[10] එමඟින් නකත් කෙළි නම් වූ සැණකෙළිය විනෝදාත්මක සැණකෙළියක් බව පැහැදිලිය.

**සද්ධර්මාලංකාරය**, **බෝධිවංශය**[11] වැනි ග්‍රන්ථයන්හිත් දෙවනපෑතිස් රජු පවත්වන ලද නැකත් කෙළිය පිළිබඳ තොරතුරු සඳහන් වෙයි. **බෝධිවංශයේ** ''සියලු ලඞකාද්වීප වාසි වූ සත්වයන් උත්සව කෙළි කෙළනා පරිද්දෙන් නක්‍ෂත්‍ර ඝෝෂණය කරවා පුරවාසී වූ සත්ත්වයන් නකත් කෙළි කෙළනට පටන් ගත් කල්හි''යනුවෙන් දැක්වෙයි. ''අප බුදුන් පිරිනි වී දෙසිය සතිස් වන හවුරුදු ධර්මාශෝක රජ හට අටළොස් වන්නෙහි දෙවනපෑතිස් රජ හට පළමු වන්නෙහි එම මිහිඳු තෙරුන් වහන්සේ උපසම්පදා වූ දොළොස්වන හවුරුදු පොසොන් පුර මුල නකත ලද පසළොස්වක් දවස යැ. එසේ හෙයින් දෙවනපෑතිස් රජ්ජුරුවෝ පළමු සත් දවසක පටන් මුළු නුවර දෙව් පුරයක් සේ සරසා සැණකෙළි කෙළනාහු ඒ දවස් නුවර වැසියන් හා මහඇමතියන් නකත් කෙළි කෙළනා සේ නියෝගකොට තුමු සතිළිස් දහසක් පුරුෂයන් පිරිවරා මිහින්තලාවට මුව දඩ ගියහ.'' යන **සද්ධර්මාලංකාරයේ** සඳහනින් දෙවනපෑතිස් රජු මුළු නුවර දෙව් පුරයක් ලෙස සරසා සැණකෙළි පැවැත් වූ අතර නුවර වැසියන් සහ මහඇමතියන්ට නැකැත් කෙළි කිරීමට නියෝගකොට මුව දඩයමේ ගිය බව පෙනෙයි.[12] ඉන් පෙනෙන්නේ නැකැත් කෙළිය පොසොන් මාසයෙහි යම්කිසි නැකැත් යෝගයක් ආශ්‍රයෙන් සිදුකළ බවක්ය. **මහාවංසයේ**[13] දෙවනපෑතිස් රජු නගර වැසියන්ට දියකෙළි නියම කර ඔහු මුව දඩකෙළියට ගිය බව සඳහන් වෙයි. එහි සඳහන් තොරතුරුවලින් දියකෙළියක් යැයි ද කිය වේ. මෙමඟින් නැකැත් කෙළිය යන්නෙන් අදහස් කරන්නේ උයන් දිය කෙළියම යයි මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ මතය තහවුරු වේ.[14]

දඩයම් කිරීමට රජවරු විශේෂ කැමැත්තක් දැක් වූ ක්‍රීඩාවක් බව ජාතක කතා තුළින් පවා පැහැදිලි වේ. නමුත් බෞද්ධ රජවරු දඩයමට රුචියක් දැක්වූවා ද යන්න කීමට අසීරු වන්නේ ඔවුන් බෝධිසත්ව ගුණයන්ගෙන් යුක්ත වූවන් බව සලකන හෙයින්ය.[15] ජෝන් ඇම්. සෙනවිරත්න මහතා ලංකාවේ බුද්ධාගම පිහිටුවීමෙන් අනතුරුව මෙරට රජුන් දඩයමෙන් විනෝදය නොලැබූ බව පවසයි.[16] දෙවනපෑතිස් මුව දඩයමේ ගිය බව ඉහතින් සඳහන් කරන ලදී. මෙය බුද්ධාගම වැළඳ ගැනීමට පෙර සිදු වූවකි. එහෙත් නිශ්ශංකමල්ල රජුගේ ගල්පොත ශිලා ලේඛනයේ[17] ඔහු ද දඩයෙමේ ගිය බවක් පෙනේ. **චූලවංසයේ**[18] මහා පරාක්‍රමබාහු රජු දඩයමේ ගිය අවස්ථාවක් පිළිබඳවත් තොරතුරු සඳහන් වේ.

මහින්දාගමනය සම්බන්ධයෙන් අවධානය යොමුකිරීමේ දී සෑම ක්ෂේත්‍රයන්හිම විශාල වෙනසක්, පරිවර්තනයක් වූවක් බව පැහැදිලි වේ. එමඟින් ජනයා තුළ වූ සිතුම් පැතුම් ආදයෙහි පැහැදිලි වෙනසක් විය. එය ඉතාමත් අර්ථාන්විතවත්, සමාජයෙහි කිසිවකුට අයහපතක් නොවන ආකාරයෙනුත් යුක්ත විය. ඒ සඳහා බලපානු ලැබූ ප්‍රධාන සාධකය වූයේ සදාචාරාත්මක ආගමික පදනම ශක්තිමත් වීමය. එම කාර්යභාරය ඉටුකිරීමේ දී භික්ෂුවට විශාල වගකීමක් පැවරුණු බව නොකිව යුතුය. භික්ෂූන් වහන්සේ සමාජයෙහි ගුරුවරයා මෙන්ම උපදේශකයකු ලෙස ක්‍රියාකිරීම තුළින් මෙරට සමාජය ධාර්මික අරමුණු වෙත යොමු කිරීමෙහිලා විශාල දායකත්වයක් දැරීය.[19] එම කාර්යයේ භික්ෂුව නිරත වු අයුරු අට්ඨකථා තුළිනුත් පැහැදිලි වේ. **අංගුත්තරනිකායට්ඨකථාවේ** සඳහන් මිලක්ඛතිස්ස තෙරුන් සම්බන්ධ පුවත,[20] මධුඅංගන ගමේ දොරටුපාලයා සම්බන්ධ පුවත[21] ආදියෙන් පෙනීයන්නේ එකී කාර්යභාරයයි. පුද්ගල චර්යාවේ වටිනාකමත් ආත්ම සංයමයේ උසස් බව පෙන්වා දීමත් සදාචාරාත්මක මාවතක් වෙත පුද්ගල ක්‍රියාකාරීත්වය මිහිඳු හිමියන් ඇතුළු ධර්ම දූත පිරිස ශ්‍රී ලාංකේය සමාජයට හඳුන්වා දීම මත ඉතාමත් විගසින් බුදුදහම පැතිරීමට හේතුවක් විය.[22] එම ආත්ම සංයමය, සදාචාරාත්මකභාවය



මත මෙරට ජනයා ක්‍රියාකාරී වූ බවත් තම ජීවිතය හැඩගස්වාගත් අයුරුත් අටුවා ග්‍රන්ථ මඟින් පැහැදිලි වේ.[23]

මහින්ද හිමියන් විසින් ආරම්භ කළ ධර්මදේශනා මාලාව මේරට ජනතාවගේ සුචරිතවාදීභාවයත් ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසාත් විශාල වශයෙන් පිටිවහලක් වූ බව කිව යුතුය.[24] **චූල්ලහත්ථිපදෝපම සූත්‍රය, විමානවත්ථු, පේතවත්ථු** ආදී දේශනාවන්හි අන්තර්ගතය විමසීමේ දී මෙය තවදුරටත් තහවුරු කරගත හැකිය.[25] ඒ අනුව මහින්දාගමනයෙන් අනතුරුව ශ්‍රී ලාංකේය ජනයා අතර සමානාත්මතාවය,[26] පරාර්ථචර්යාව,[27] කරුණාව,[28] සරලබව,[29] අල්පේච්ඡතාවය[30] ආදී ගුණාංගයන්[31] ගිහි පැවිදි දෙපාර්ශවයෙන්ම විදහාපාන්නට විය.එසේම මහින්ද හිමියන්ගේ දේශනා තුළින් සුඛිත මුදිත ජීවිතයකට ආගමෙහි සදාචාර පක්ෂය අවශ්‍යය බව අවධාරණය කිරීමත් ශ්‍රාවක පිරිසට ආධ්‍යාත්මික වර්ධනය පිළිබඳ කියාපෑමත් මෙම දේශනාවලින් සිදුවිය.[32]

ජනතාව තුළ සදාචාරාත්මක ලක්ෂණයන් ඉස්මතු කොට ඒවා ඔවුනගේ ජීවිතයෙහි සෑම කටයුත්තකටම සමීප කරවීමට භික්ෂුවට මහත් දායකත්වයක් සැපයිය හැකිය. එහි දී උන්වහන්සේට ජනයාගේ ආධ්‍යාත්මික ගුණයන් සංවර්ධනය කිරිම උදෙසා අවවාදානුශාසනා දීමෙන් සහ ආගමික වශයෙන් නොයෙකුත් කාර්යයනට ජනයා ඒකරාශී කරගැනීම වඩාත් උචිතය. එකී කාර්යය සපල කරගැනීම උදෙසා භික්ෂුව ක්‍රියාකළ අයුරු මෙරට දී නොයෙකුත් ධර්ම දේශනා ආදිය සඳහා ජනතාව යොමුකොට තිබෙන අයුරින්පෙනීයයි. ඒ අනුව නොයෙකුත් ආකාරයේ ධර්මදේශනා ක්‍රම තිබු අතර ඒ සඳහා විශේෂ ධර්මදේශනා මණ්ඩපයන්[33] පවා තනා තිබූ බව **සංයුක්තනිකායට්ඨකාථාවේ** සඳහන් වේ. එසේම සර්වරාත්‍රික ධර්මදේශනා පවා මේවායෙහි පැවැත් වූ බවත් ඒ සඳහා බොහෝ ඈත ප්‍රදේශයන්ගෙන් පවා පිරිස පැමිණියහ.[34] අට්ඨකථාවල සහ වංසකථාවන්හි නිරතුරුව දක්නට ලැබෙන ධර්මදේශනයක් වන්නේ අරියවංශ දේශනාවයි.[35] තෝනිගල සෙල්ලිපියෙහි,[36] ලබුඇටබැදිගල[37] සෙල්ලිපිවල අරියවංස

දෙසුම පිණිස වියදම් කිරීම සම්බන්ධයෙන් තොරතුරු සඳහන් වේ. මෙම උත්සවයෙහි ජනප්‍රියභාවය සම්බන්ධයෙන් අට්ඨකථා මූලාශ්‍රවල එන තොරතුරු මඟින් පෙනීයයි. ඒ අනුව දීඝභාණක අභය තෙරුන් පැවැත් වූ අරියවංස ධර්ම දේශනයක් ඇසීමට කාන්තාවක් තම ළදරුවා කිරි පොවමින් යොදුන් පහක් ගෙවා ගිය බව **අංගුත්තරනිකායට්ඨකථාවේ** සඳහන් වේ.[38] එම අට්ඨකථාවේම ගවරවාල අංඝනයෙහි වස් වසා සිටි භික්ෂූන් 30 නමක් දෙසතියකට වරක් මෙම අරියවංසය දේශනා කළ බව දක්නට ලැබේ.[39] මෙවැනි ක්‍රියාමාර්ග පදනම් කොටගෙන ජනතාවගේ ධර්ම ඥානය මෙන්ම ගුණධර්මයන් ද දියුණු වූ බව නොඅනුමානය.

සදාචාරාත්මක හැඟීම් කෙතරම් දුරට සමාජයට බද්ධ වී පැවතියා ද යන්න අටුවා ග්‍රන්ථයන්හි එන ඇතැම් තොරතුරු සාක්ෂි සපයනු ලැබේ. මෙකී සදාචාරාත්මක පැවැත්ම නිසා භාතිකාභය රජු ගවමස් කෑම නීතියෙන් තහනම් කර නීතියට පටහැනිව ගවමස් කෑ පිරිස වසලයන් කර වූ බව අට්ඨකථාවන්හි සඳහන් වීමෙන් එය පෙනීයයි.[40] සදාචාර මාර්ගය ක්‍රියාවෙන්ම පාලකයන් විසින් විදහා පා එය ජනතාව අතරට කාවැද්දීම කළ අයුරු සද්ධාතිස්ස රජු[41] සිල් සමාදන්වීම, වසභ රජු[42] ශික්ෂාපද ආරක්ෂා කිරීමට කටයුතු කිරීම ආදිය මඟින් පෙනෙයි. එවැනි ක්‍රියාවන් ලක්දිව ජනතාව අනුගමනය කරන්නට ඇති බව අනුමාන කළ හැකිය. ඒ තුළින් සමාජයෙහි සදාචාරාත්මක ගුණයන් වර්ධනය විය. ඒ නිසාම **සද්ධම්මෝපායනයේ** සඳහන් පරිදි තමාට මරණීය දණ්ඩනය හිමිවුව ද ප්‍රාණඝාතයෙන් වැළකී සිටීමට පුද්ගලයකු ක්‍රියා කිරීමෙන් පැහැදිලි වෙයි.[43] **පපඤ්චසූදනීයට** අනුව තමාගේ ජීවිතය තොර වුවද සිය දිවිය ආරක්ෂා කරගැනීමට පිඹුරකු නොමැරුවේ තමා සමාදන් වූ පඤ්චශීලයට හානියක් සිදුවේය යන්න නිසාය.[44] එසේම තමාගේ මවගේ ජීවිතය ආරක්ෂා කිරීම සඳහා සතෙකුට හානී කරවීමට නොකැමති වූයේ[45] මේකී සදාචාරාත්මක හැඟීම ජනයා තුළකාවැදී තිබූ හෙයින්ය.



ඒ අනුව ඉහත සඳහන් කරුණු තුළින් නැකැත් කෙළිය ඉතාමත් විනෝදාත්මක සැණකෙළියක් වශයෙනුත් එය රාජකීය උත්සවයක් වශයෙනුත් දැක්විය හැකිය. කෑම්, බීම්, නැටීම්, ගී කීම් ආදියෙන් සමන්විත ප්‍රීතිමත් උත්සවයක් වශයෙනුත් එය පෙන්වා දිය හැකිය.

## ආන්තික සටහන්

1. සද්ධර්මරත්නාවලිය, (සර) සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 2007, පිටුව 818.
2. ඇම්. බී. ආරියපාල, මධ්‍යකාලීන ලංකා සමාජය, 13 ශතවර්ෂයට අයත් සද්ධර්මරත්නාවලියෙහි හා වෙනත් සාහිත්‍ය කෘතිවල නිරූපනය වන ලංකා සමාජයේ තත්ත්වය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1962, පිටුව 347.
3. එම, පිටුව 345.
4. පූජාවලිය, (පූජා) සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 2008, පිටුව 329.
5. එම, පිටුව 345.
6. මාර්ටින් වික්‍රමසිංහ, පුරාණ සිංහල ස්ත්‍රීන්ගේ ඇඳුම, මහරගම, සමන් මුද්‍රණාලය, 1950, පිටු 62, 64.
7. පූජා, පිටුව 126.
8. එම, පිටුව 347.
9. එම, පි. 166.
10. සර, පිටුව 222.
11. බෝධිව, පිටුව 147.
12. සද්ධලං, පිටුව 349.
13. මහාවංශය (සිංහල), සංස්. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2012, පි.50; ඌපූම, පරි. 14. .ගා.1.
14. ආරියපාල, එම, 1962, පිටු 345-346.
15. එම, පිටුව 39.
16. ***JRAS*** (CB), No. 71, Part II, p 133.
17. "ක්‍රීඩා වනයෙහි ඉදිරියට කකාරා පිනු කුරිරු වැලසින්න දිවු කැඩී සිය පිළුන් හා සැමැගැ පාපිට හෙළු" ***Epigraphia Zeylanica***, II, (EZ) ed. D. M. D. Z. Wicramasingha, London: Oxford University Press, 1928, No.3, p 105.

18. ''ඉක්බිති රජ තෙමේ එක් දිනක් අමාත්‍යයන් හා ජනයා විසින් පිරිවරන ලදුව මෙහෙසියන් සමඟ මුව දඩයම පිණිස ගියේ ය; මෘගයන් ප්‍රවිෂ්ට වූ ලකුණු ඇති එක් මහවනයක් දුටු ඒ බුව්පල් තෙමේ මෙහෙසිය එක් අවකාශ ස්ථානයෙක් හී හිඳුවා, ශස්ත්‍රි හස්තවත් වූ හෙවත් තෙප් ගත් අත් ඇති ව්‍යාධ පුරුෂයන් ලවා ඒ වනය මුව දැලින් අවුරවා ඔවුන් රැකවල් පිණිස සිටු වුයේය; මෙසේ කොට මිනිසුන් ලවා මහත් වූ ඝෝෂා කරවිය. ඒ උද්ඝෝෂණයෙන් බියෙන් තැතිගනු ලැබූ හස්ති පෝතකයෙක් පමණ මහත් වූ ගෝණෙක් වන ගුම්බයෙන් නික්ම .... මෙහෙසිය අභිමුවට දිව ආයේ ය... රජතෙමේ දිව එන්නා වූ බියකරු වූ ඒ ගෝණාගේ ඉදිරියට (වේගයෙන්) දිව අවුත් තෙබ දමා ඇන්නේ ය; ඒ රජහු විසින් අන්නා ලද පහර ලැබත් අනින පිණිස හිස නමන විට සිගුයුවල ගිලිහී රජහු පාමුල හින්''මහාවංශය (සිංහල), 2012. සංස්. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,පිටුව 280.
19. හඟුරන්කෙත ධීරානන්ද හිමි, රාජත්වය, රාජ්‍යය සහ ආගම, වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ, 2004, පිටුව 314.
20. මනොරථපුරණී, සංස්. සයිමන් හේවාවිතාරන, කොළඹඃ ත්‍රිපිටක ප්‍රකාශන මුද්‍රණාලය, 1923, පිටු 21, 29.
21. එම, කාණ්ඩය I, පිටුව 367.
22. ධීරානන්ද හිමි, එම, 2005, පිටුව 86.
23. මනොරථ, පිටු 21, 29, 367.
24. සමන්තපාසාදිකාව, සංස්. සයිමන් හේවාවිතාරණ, කොළඹඃ ත්‍රිපිටක ප්‍රකාශන මුද්‍රණාලය, 1900, පිටුව 45.
25. එම.
26. පපඤ්චසූදනි, සංස්. සයිමන් හේවාවිතාරණ, කොළඹඃ ත්‍රිපිටක ප්‍රකාශන මුද්‍රණාලය, 1933, පිටුව 204.
27. මනොරථ, පිටුව 276; පපඤ්ච, පිටුව 263.
28. සද්ධර්ම, පිටුව 66.
29. විසුද්ධි, පිටුව 29.
30. සම්මොහ, පිටුව 273.
31. Ananda Wikramarathn, ***Buddhism and Ethnicity in Sri Lanka: a historical Analysis***, New Delhi: Vikas Publishers, 1995, pp 80-93.
32. රාහුල හිමි, එම, 1963, පිටු 82-.83.
33. සංයුක්ත නිකාය, අ කාණ්ඩය III, පිටුව152.
34. පපඤ්ච, පිටුව 205, සම්මොහ, පිටුව 244, මනොරථ, පිටු 85-.86.



35. ඌනපූරණ සහිතො මහාවංසො, (ඌපූම) සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹඃ ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959, පරි.36 හා 38, මනොරථ, පිටුව 386.
38. ***Epigraphia Zeylanica***,III, ed. S. Paranavitana, London: Oxford University Press, 1933, p 177.
37. ***Ibid***, pp. 250-251.
38. මනොරථ, පිටුව 386.
39. එම.
40 සම්මොහ, පිටුව 113, මනොරථ, පිටුව 200.
41. පපඤ්ච, පිටු 449-.470.
42. ඌපුම, පරි. 36, ගා. 23.
43. සද්ධම්ම, පි. 66.
44. පපඤ්ච, කාණ්ඩය I, පිටුව 204.
45. එම.